විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS

මාලිගාවත්ත සෙක්‍රටේරියට්, මාලිගාවත්ත, කොළඹ 10. மாளிகாவத்தை செயலகம், மாளிகாவத்தை, கொழும்பு 10. Maligawatte Secretariat, Maligawatte, Colombo 10.

අංකය / இல. / No. } විවැ/චක්‍රලේඛ/2012 දිනය / திகதி / Date } 2012- 05- 28

විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 10/ 2011 (සංශෝධන 02)

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිසා ලේකම්වරුන්/ ප්‍රාදේශීය ලේකම්වරුන්,

2011 අයවැය යෝජනා අනුව රාජ්‍ය සේවයේ වැටුප් හා දීමනා සංශෝධනය කිරීම

උක්ත කරුණට අදාලව මවිසින් නිකුත් කරන ලද 2011- 12- 15 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 10/ 2011 හා 2012- 02- 03 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 10/ 2011 (සංශෝධන 01) කෙරේ අවධානය යොමු කරවමි.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 28/ 2010 හා 28/ 2010 (I) වැටුප් සංශෝධනය මත විශ්‍රාම වැටුප් සංශෝධනය කිරීමේදී සංශෝධිත විශ්‍රාම වැටුප් අයදුම්පත්‍ර මෙම දෙපාර්තමේන්තුව වෙත එවීම නොකළ යුතු බවත් සංශෝධිත ප්‍රදාන පත්‍රය සකස්කොට එය ප්‍රාදේශීය ලේකම් වෙත සෘජුව යැවිය යුතු බවත් මවිසින් නිකුත් කරන ලද උක්ත විශ්‍රාම වැටුප් චක්‍රලේඛ මඟින් ඔබ වෙත උපදෙස් ලබා දී ඇත.

කෙසේ වෙතත් මෙම උපදෙස් මත ක්‍රියා නොකොට සංශෝධිත විශ්‍රාම වැටුප් අයදුම්පත්‍ර මෙම දෙපාර්තමේන්තුව වෙත එවා ඇති අතර, මීට අමතරව ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත යොමු කිරීම හේතුවෙන් ද්විත්ව ගෙවීම් සිදුව ඇත. මේ හේතුවෙන් උක්ත සංශෝධනයට අදාලව ඔබ විසින් මෙම දෙපාර්තමේන්තුවෙන්ද චෙක්පත් ගෙන්වා ගෙන ඇත්නම් වහාම එම චෙක්පත් ආපසු එවිය යුතු බවත් ඒවා තැන්පතු ගිණුමේ තබා නොගත යුතු බවත් අවධාරණය කරමි.

නිලධාරියාගේ චර්යා සටහන් හා වැටුප් පරිවර්තන ලිපිය විශ්‍රාම වැටුප් ප්‍රදාන පත්‍රය සමඟ ප්‍රාදේශීය ලේකම් වෙත යැවීමට කටයුතු කළ යුතුය.

විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 10/ 2011 ප්‍රකාරව ගෙවනු ලැබූ සංශෝධනයන්ට පසුව නැවත සංශෝධනයක් ඉදිරිපත් වන්නේ නම්, ඒ පිළිබඳ විස්තර සංශෝධිත "අ" ආකෘති පත්‍රයේ 06 ඡේදයට ඇතුලත් කළ යුතුය.

විශ්‍රාම වැටුප් ප්‍රදාන පත්‍රයේ ප්‍රදානය ගෙවීම ඇරඹිය යුතු දිනය සංශෝධනය නොකර පළමු ප්‍රදාන දිනයම සඳහන් කර වරහන් තුළ හිඟ විශ්‍රාම වැටුප ගෙවන දිනය 2011- 07- 01 දින ලෙස සඳහන් කළ යුතුය. ඒ අනුව, දස අවුරුදු පිරෙන දිනයේ වෙනසක් සිදු නොවන බව ද කාරුණිකව දන්වමි.

කේ. ඒ. තිලකරත්න
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් : 01. ජනාධිපති ලේකම්
02. අග්‍රාමාත්‍ය ලේකම්
03. ලේකම් - රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
04. විගණකාධිපති,

	Telephone	Fax		Telephone	Fax		Telephone
Director General	2431647	2342078	W&OP	2332346	2432214	Policy	2329580
Director	2432008	2342078	PSPF	2324375	2332347	Forces	2320439
Director (F)	2434974	2391403	L.G.U.	2342525	2342525	Computation	2434414
Internal Auditor	2329634	2329634	Registration	2329178	-	Payments	2431612

E-mail: pensions@sltnet.lk
Web site: www.pensions.gov.lk